WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

**නැටුම් (දේශීය) I, II**
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

2018.12.11 / 0830 - 1140

පැය තුනයි
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## නැටුම් (දේශීය) I

**විශේෂ උපදෙස් :**

※ සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න 30 ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

※ **II, III** හා **IV** වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

### I කොටස

● අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

**1.** වන්නමක .............................. මගින් පිළිබිඹු වන්නේ එහි නාදමාලාවයි.
(1) බෙරපදය (2) තානම (3) ප්‍රස්තාරය (4) තිත

**2.** කාසි රටේ සිට පැමිණි බැව් කියන .............................. සොකරියගේ ස්වාමි පුරුෂයා වේ.
(1) සොත්තානා (2) වෙදරාළ (3) අඬබෙරකරු (4) ගුරුහාමි

**3.** මහනුවර ඇසළ පෙරහැර, මුල් දින පහ වීදි සංචාරය කරනු ලබන්නේ.................... පෙරහැර නමිනි.
(1) රන්දෝලි (2) කුඹල් (3) වේල් (4) නවම්

**4.** ශාන්තිකර්මවල දක්නට ලැබෙන නමස්කාර, සන්න, සැහැලි හඳුන්වනු ලබන්නේ .............................. ගායනා ලෙස ය.
(1) තාලාත්මක (2) අසාතාත්මක (3) අනාඝාතාත්මක (4) ලයාන්විත

**5.** ආදරය, දුක, පිළිකුල වැනි මිනිස් හැඟීම් .............................. අභිනයෙන් නිරූපණය කෙරේ.
(1) ආංගික (2) වාචික (3) සාත්වික (4) ආහාර්ය

**6.** මාත්‍රා $2+2+3$ තිත් රූපය නම් කරනු ලබන්නේ .............................. තුන්තිත ලෙස ය.
(1) දෙසුළු මැදුම් (2) සුළු මැදුම් මහ (3) දෙමැදුම් මහ (4) සුළු දෙමැදුම්

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

7. නර්තන ශිල්පියකු ................................ කිරීමේදී සමේ වර්ණය පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.
(1) රංග රචනය (2) අංග රචනය (3) තිර රචනය (4) රේඛා රචනය

8. දකුණු ඉන්දියාවේ නාගපට්ටනමෙන් ගෙන්වාගත් .................................... නම් පඬිවරයා විසින් උඩරට වන්නම් රචනා කළ බැව් කියැවේ.
(1) විද්‍යාලංකාර (2) ශෝභාලංකාර (3) වික්‍රමාලංකාර (4) ගණිතාලංකාර

9. සරස්වතී මණ්ඩපය, පොළොන්නරු යුගයේදී ................................................ රජු විසින් ඉදි කළ බව චූලවංශයේ සඳහන් වේ.
(1) දෙවන පරාක්‍රමබාහු (2) පළමුවන පරාක්‍රමබාහු
(3) දෙවන රාජසිංහ (4) කීර්ති ශ්‍රී රාජසිංහ

10. "සොබමන් දෙව්වරු ........................................ එතැනට" යන කවි පාදය චාමර ගායනයට අයත් වේ.
(1) දෙදෙනෙක් (2) සදෙනෙක් (3) තිදෙනෙක් (4) සොලොසක්

11.   

ඉහත ඡායාරූපවලින් පිළිබිඹු වන රසයන් වනුයේ,
(1) ශාන්ත, කරුණ, බිභත්ස්‍ය වේ (2) බිභත්ස්‍ය, කරුණ, රෞද්‍ර වේ.
(3) වීර, හාස්‍ය, කරුණ වේ. (4) හාස්‍ය, කරුණ, වීර වේ.

12. කාන්තා ලාලිත්‍යය මතුකර පෙන්වන නර්තනයකි.
(1) කළගෙඩි (2) ලී කෙළි (3) කඩු (4) බුම්මැඩි

13. උපුල්වන් දේවාලයේ හින්දු බාලිකාවන් 500ක් නැටූ බව වාර්තා කරන ලද්දේ,
(1) පාහියන් භික්ෂුව ය. (2) ස්පිල් බර්ජන් ය. (3) රොබට් නොක්ස් ය. (4) ඉබන් බතූතා ය.

14. ගොයම් කැපීමට සමාන දමිළ නර්තනය වනුයේ,
(1) අරුවිවෙට්ටු ය. (2) කුම්මි ය. (3) චෙම්බු ය. (4) සූලකු ය.

15. වර්ණ, රේඛා, හැඩතල භාවිත ඇඹීමේ කලාව සෘජුවම දක්නට ලැබෙන්නේ,
(1) පහන් මඩුවේදී ය. (2) දෙවොල් මඩුවේදී ය. (3) තොරන් යාගයේදී ය. (4) බලි යාගයේදී ය.

16. '**තානායම්පොළ**' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) සොකරි රඟමඬල ය. (2) කෝලම් රඟමඬල ය.
(3) නාඩගම් රඟමඬල ය. (4) නව රඟමඬල ය.

17. '**අසුර යක්කම**' ඇතුළත් ශාන්තිකර්මය අයත් වනුයේ,
(1) උඩරට සම්ප්‍රදායට ය. (2) පහතරට සම්ප්‍රදායට ය.
(3) සබරගමු සම්ප්‍රදායට ය. (4) උඩරට හා පහතරට සම්ප්‍රදායට ය.

18. රාධා ක්‍රිෂ්ණ ප්‍රේම වෘත්තාන්තය තේමා කරගනිමින් නිර්මාණය වී ඇති මනිපුරි නර්තනයකි.
(1) භාවලීලා (2) රාස්ලීලා (3) පුංචොලම් (4) සංකීර්තන්

[තුන්වැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**19.** '**කච්ච කෙට්ට**' නම් අභ්‍යාස පුහුණුව ලබා දෙන නර්තන සම්ප්‍රදාය වනුයේ,

(1) මනිපුරි ය. (2) කතක් ය. (3) කථකලි ය. (4) භරත ය.

**20.**



A



B



C

ඉහත රූපවලින් මානුෂ හා අතිමානුෂ චරිත අනුපිළිවෙළින් දැක්වෙන්නේ,

(1) A හා B රූපවලිනි. (2) A හා C රූපවලිනි.
(3) B හා C රූපවලිනි. (4) B හා A රූපවලිනි.

**21.** සංගීතයේ මාධ්‍ය නාද වන්නාසේ ම නර්තනයේ මාධ්‍යය වනුයේ,

(1) වාදනයයි. (2) ගායනයයි. (3) චලනයයි. (4) වර්ණයයි.

**22.** තාලය තැබීමට යොදා ගන්නා ඝන වාද්‍ය භාණ්ඩ වේ.

(1) තාලම්පට, අත්මිණිය, තලිය (2) තාලම්පට, බුම්මැඩිය, අත්මිණිය
(3) අත්මිණිය, හක්ගෙඩිය, තාලම්පට (4) අත්මිණිය, හක්ගෙඩිය, රහු






**23.** කොහොඹාහැල්ල, මුදුන් තාලය, දෙවොල් යන නර්තන දක්නට ලැබෙන්නේ පිළිවෙළින්,

(1) කොහොඹා කංකාරිය, කිරිමඩුව සහ හැල්ලම්මඩුවේ ය.
(2) කොහොඹා කංකාරිය, කිරිමඩුව සහ ගීමඩුවේ ය.
(3) කොහොඹා කංකාරිය, පහන්මඩුව සහ පූනාමඩුවේ ය.
(4) කොහොඹා කංකාරිය, පහන්මඩුව සහ දෙවොල්මඩුවේ ය.

**24.** කැලණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය බවට පත් වන්නේ,

(1) 1972 වසරේදී ය. (2) 1974 වසරේදී ය. (3) 1978 වසරේදී ය. (4) 2005 වසරේදී ය.

● ප්‍රශ්න අංක **25** සහ **28** සඳහා නිවැරදි පිළිතුරු පහත වගුව ඇසුරින් තෝරන්න.

| | 1 | 2 | 3 |
|---|---|---|---|
| A |  |  |  |
| B |  |  |  |

**25.** දේශීය භාණ්ඩ වර්ගීකරණයේදී අතතය කොටසට අයත් භාණ්ඩ දක්නට ලැබෙන්නේ,

(1) A තීරුවේ 1 හා 2 රූපවල ය. (2) B තීරුවේ 2 හා 3 රූපවල ය.
(3) A තීරුවේ 1 හා 3 රූපවල ය. (4) B තීරුවේ 1 හා 3 රූපවල ය.

**26.** කථකලි නර්තනය සඳහා භාවිත කරනු ලබන චෙන්ගිලම් සහ චෙන්ඩාව දක්නට ඇත්තේ,

(1) A තීරුවේ 1 හා 2 රූපවල ය. (2) A තීරුවේ 2 හා 3 රූපවල ය.
(3) B තීරුවේ 2 හා 3 රූපවල ය. (4) B තීරුවේ 1 හා 3 රූපවල ය.

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**27.** මෙලෙයි යකුන් හා රුප්පා යකුන් පුදනු ලබන්නේ,
(1) උඩරට සම්ප්‍රදායේ ය.
(2) පහතරට සම්ප්‍රදායේ ය.
(3) සබරගමු සම්ප්‍රදායේ ය.
(4) සම්ප්‍රදායන් තුනෙහිම ය.

**28.** දිවිකදුරුද ගස එතැන තියෙන්නේ, සත්වියතක් දිග .................... මෙහි හිස්තැන සම්පූර්ණ වන්නේ,
(1) සොදින් කපන්නේ ලෙසිනි.
(2) මොහොල කපන්නේ ලෙසිනි.
(3) මිල්ල කපන්නේ ලෙසිනි.
(4) විල්ල කපන්නේ ලෙසිනි.

**29.** වෙහෙර විහාරස්ථානවල බුදු ගුණ ගයමින් කරනු ලබන පන්තේරු නර්තනයකි.
(1) ගාහක වන්නම
(2) දොරකඩ අස්නය
(3) සුවිසි විවරණ
(4) කුවේණි අස්නය

**30.** සැලලිහිණිය, තිත්ත බත, පරෙවිය මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
(1) ඒ. ඉලුල්ගොඩ ය.
(2) නිමල් වෙල්ගම ය.
(3) වසන්ත කුමාර ය.
(4) ප්‍රේමකුමාර එපිටවෙල ය.

## II කොටස - උඩරට නර්තනය

**31.** උඩරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ,
(1) මහනුවර, කුරුණෑගල සහ තංගල්ල ය.
(2) මහනුවර, කුරුණෑගල සහ කෑගල්ල ය.
(3) දෙවිනුවර, කුරුණෑගල සහ ගාල්ල ය.
(4) දෙවිනුවර, උඩුනුවර සහ ගාල්ල ය.

**32.** කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ එන නර්තනාංග දෙකකි.
(1) අස්නේ සහ වැදි යක්කම
(2) කොහොඹාහැල්ල සහ අයිලේ යැදීම
(3) අස්නේ සහ යක් ඇනුම
(4) යක් ඇනුම සහ හඟලේ යැදීම

**33.** සුළු මැදුම් (2 + 3) දෙතිතට අයත් අඩව්ව කුමක් ද?
(1) තත් තකට තක රොං
(2) තත් තොග තක තොග
(3) තත් තහර්ජිත් ජිත් තහර්ජිත්
(4) තත්ත තරිතරි තතරි තරිතරි

**34.** උඩරට වෙස් නර්තනයට අයත් ආභරණ වනුයේ,
(1) උල්උඩය හා හැඩ කැල්ලයි.
(2) අවුල්හැරය හා කාගුල් කුට්ටමයි.
(3) උල්උඩය හා දෙවොල් තොප්පියයි.
(4) අවුල්හැරය හා ශිඛාබන්ධනයයි.

**35.** දෙතිතට අයත් වන්නම් දෙකකි.
(1) සැව්ලා සහ තුරඟා
(2) සිංහරාජ සහ හනුමා
(3) හනුමා සහ සැව්ලා
(4) හනුමා සහ තුරඟා

**36.** "වන පැත්ත බිය පත්ව සයනම් - දුටත් යනෙන විටත් දුවන" මෙම කවිය අයත් වනුයේ,
(1) සිංහරාජ වන්නමට ය.
(2) හනුමා වන්නමට ය.
(3) මුසලඩි වන්නමට ය.
(4) වෛරොඩි වන්නමට ය.

WWW.OLEVELAPI.COM

**37.** දොං ජිංත ගත දොංත යන බෙර පදය අයත් වනුයේ,
(1) මාත්‍රා 123 + 1234 දෙතිතට ය.
(2) මාත්‍රා 12 + 123 දෙතිතට ය
(3) මාත්‍රා 12 + 1234 දෙතිතට ය
(4) මාත්‍රා 123 + 123 තනිතිතට ය

**38.** කුදාංත ගත දොම් වට්ටම නර්තනය කරනු ලබන්නේ
(1) දෙසුළු මහ තුන්තිතට ය.
(2) සුළු මැදුම් මහ තුන්තිතට ය.
(3) මැදුම් මහ දෙතිතට ය.
(4) සුළු මහ දෙතිතට ය.

**39.** කොහොඹා යක් කංකාරිය සහ සමාජය කෘතිය රචනා කරන ලද්දේ
(1) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ය.
(2) මහාචාර්ය මුදියන්සේ දිසානායක ය.
(3) මහාචාර්ය තිස්ස කාරියවසම් ය.
(4) මහාචාර්ය ලයනල් බෙන්තරගේ ය.

**40.** ගොයම් නර්තනය නිර්මාණය කර වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමි වනුයේ,
(1) ප්‍රවීණ නර්තන ශිල්පී ප්‍රේමකුමාර එපිටවලට ය.
(2) ප්‍රවීණ නර්තන ශිල්පී නිමල් වෙල්ගමට ය.
(3) ආචාර්ය එස්. පණිභාරතට ය.
(4) ආචාර්ය චිත්‍රසේනයන්ට ය.

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## III කොටස - පහතරට නර්තනය

**31.** පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ
(1) මාතර, බෙන්තර සහ නයිවල ය. (2) මාතර, බෙන්තර සහ රයිගම ය.
(3) කළුතර, බෙන්තර සහ රත්නපුරය ය. (4) කළුතර, බෙන්තර සහ මහනුවර ය.

**32.** දෙවොල්මඩු ශාන්තිකර්මයේ එන නර්තනාංග දෙකකි,
(1) තෙල්මේ සහ මිල්ල කැපීම (2) අඹ විදමන සහ මිල්ල කැපීම
(3) තෙල්මේ සහ දෙවොල් (4) අඹ විදමන සහ දෙවොල්

**33.** සුළු මහ (2 + 4) දෙතිතට අයත් ඉරට්ටිය කුමක් ද?
(1) දොම් තත් දිමි ගත ගුගුදිත (2) ගුද ගති ගත ගුද
(3) දිං ගදිත තං දොංත (4) තකදිත් තක දොම්

**34.** පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලයට අයත් වනුයේ,
(1) සේලය සහ කාගුල් කුට්ටමයි. (2) තෙල්කච්චිය සහ අවුල්හැරයයි.
(3) සේලය සහ බුබුලු පටියයි. (4) තෙල්කච්චිය සහ පබලු හැට්ටයයි.

**35.** තනිතිතට අයත් සින්දු වන්නම් දෙකකි.
(1) අනුරාග දණ්ඩ තාලය සහ හනුමන්තා තාලය (2) ශුද්ධ තාලය සහ හනුමන්තා තාලය
(3) නාතිලිංචි තාලය සහ හනුමන්තා තාලය (4) නාතිලිංචි තාලය සහ අනුරාගදණ්ඩ තාලය

**36.** සිරි පිර ගිරි මුදුනත සුර - පුර ලෙසිනා, මෙම කවිය අයත් වනුයේ,
(1) නාතිලිංචි තාලයට ය. (2) අනුරාගදණ්ඩ තාලයට ය.
(3) ශුද්ධ තාලයට ය. (4) ඊශ්වරකුණ්ඩ තාලයට ය.

**37.** ගුං දෙගත ගත්ත ගුං යන බෙර පදය අයත් වනුයේ,
(1) මාත්‍රා 123 + 1234 දෙතිතට ය. (2) මාත්‍රා 12 + 123 දෙතිතට ය.
(3) මාත්‍රා 12 + 1234 දෙතිතට ය. (4) මාත්‍රා 123 + 123 තනිතිතට ය.

**38.** ගුද ගති ගත වට්ටම නටනු ලබන්නේ,
(1) සුළු තනි තිතට ය. (2) මැදුම් තනි තිතට ය.
(3) මහ තනිතිතට ය. (4) මැදුම් මහ තනිතිතට ය.

**39.** පහතරට ශාන්තිකර්ම සාහිත්‍ය කෘතිය රචනා කරන ලද්දේ,
(1) මහාචාර්ය ආරියරත්න කළුආරච්චි ය. (2) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ ය.
(3) මහාචාර්ය ලයනල් බෙන්තරගේ ය. (4) මහාචාර්ය තිස්ස කාරියවසම් ය.

**40.** ප්‍රථමවරට පහතරට නර්තන ශිල්පය නිර්මාණාත්මකව වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමි වනුයේ,
(1) සව්රිස් සිල්වාට ය. (2) ඩී. වී. හීන්තිලමේට ය.
(3) කේ. ඇස්. ප්‍රනාන්දුට ය. (4) එස්. එල්. එච්. ප්‍රනාන්දුට ය.

## IV කොටස - සබරගමු නර්තනය

**31.** සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ,
(1) රත්නපුර, බලංගොඩ සහ මල්වාන ය. (2) රත්නපුර, බලංගොඩ සහ කලවාන ය.
(3) බලංගොඩ, අම්බලන්ගොඩ සහ මල්වාන ය. (4) බලංගොඩ, අම්බලන්ගොඩ සහ කලවාන ය.

**32.** පහන්මඩුව ශාන්තිකර්මයේ එන නර්තනාංග දෙකකි.
(1) දේව කෝල්පාඩුව සහ කෝල්පාඩුව වේ. (2) දෙවොල් නැටීම සහ රාමා යක්කම වේ.
(3) දේව කෝල්පාඩුව සහ මුදුන් තාලය වේ. (4) දෙවොල් නැටීම සහ අසුර යක්කම වේ.

[ගයවැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**33.** සුළු මැදුම් 2 + 3 දෙතිතට අයත් අඩව්ව කුමක් ද?
(1) තත් තරිඟු තත් තකට
(2) ජිං කිටිතත් තත් කිටිතක
(3) තා තත්ජිත් තකට තත්ජිත්
(4) තහර්ද තත් තත්

**34.** සබරගමු පබළු ඇඳුම් කට්ටලයට අයත් වනුයේ,
(1) අවුල් හැරය සහ ඉනපටියයි.
(2) ශිඛාබන්ධනය සහ හැඩ කැල්ලයයි.
(3) අවුල් හැරය සහ නෙත්තිමාලයයි.
(4) නෙත්තිමාලය සහ හැඩ කැල්ලයයි.

**35.** දෙතිතට අයත් වන්නම් දෙකකි.
(1) කොවුලා වන්නම සහ මණ්ඩුක වන්නම
(2) කොවුලා වන්නම සහ විරාඩි වන්නම
(3) කොවුලා වන්නම සහ අනිලා වන්නම
(4) අනිලා වන්නම සහ විරාඩි වන්නම

**36.** "රුව සමනා, උගත් මනා - ඉසි වඩනා, රිටු නොමිනා" මෙම කවිය අයත් වනුයේ,
(1) මණ්ඩුක වන්නමට ය.
(2) විරාඩි වන්නමට ය.
(3) කොවුලා වන්නමට ය.
(4) ආනන්ද වන්නමට ය.

**37.** ජිං ජිමිත තක් තකට යන බෙර පදය අයත් වනුයේ,
(1) මාත්‍රා 123 + 1234 දෙතිතට ය.
(2) මාත්‍රා 12 + 123 දෙතිතට ය.
(3) මාත්‍රා 12 + 1234 දෙතිතට ය.
(4) මාත්‍රා 123 + 123 තනිතිතට ය.

**38.** ගමන් මාත්‍රය නටනු ලබන්නේ,
(1) මැදුම් තනි තිතට ය.
(2) මහ තනි තිතට ය.
(3) සුළු මැදුම් දෙතිතට ය.
(4) මැදුම් මහ දෙතිතට ය.

**39.** "සමන් දේවාල පුදසිරිත්" කෘතිය රචනා කරන ලද්දේ,
(1) මහාචාර්ය තිස්ස කාරියවසම් ය.
(2) මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ ය.
(3) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ ය.
(4) මහාචාර්ය මුදියන්සේ දිසානායක ය.

**40.** ප්‍රථම වරට සබරගමු නර්තන ශිල්පය වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමි වනුයේ,
(1) ඩී. වී. හීන්නිලමේට ය.
(2) ගලුකාගම හීන් මහත්තයාට ය.
(3) රද්දැල්ලේ පොඩි මහත්තයාට ය.
(4) එන්. ජී. සිරිබෝහාමිට ය.

* *

WWW.OLEVELAPI.COM

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....